සන්නස

සංස්කරණය
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

සංස්කරණ සහය
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

සන්නස පිරිවර

සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

සම්බන්ධීකරණය

NSW
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

WA
Kapila Hemantha Balage
08 9456 1972

QLD
Ananada Samaratunga
07 3372 7953

ACT
Asoka Nimalasiri
0439 925 241

SA
Chandta Eeriyagama

TAS
Anura Seneviratne
03 6327 4259

Sannasa
22 Lorne Street
Lalor Vic 3075 Australia
Web: www.sannasa.net
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380

පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

අපේ ලිපිනය
22 Lorne Street
Lalor Vic 3075 Australia
Tel/Fax : 03 9402 5380

සංස්කාරක සටහන

සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. සන්සේ පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි සිංහල, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.



ත්‍රස්තවාදීන් මර්දනයට විරුද්ධ වන්නේ ඔවුන්ට උඩගෙඩි දෙන අය

දේශප්‍රේමී හික්මූ පෙරමුණේ ලේකම් බෙංගමුවේ නාලක හිමි

දේශප්‍රේමී හික්මූ පෙරමුණේ ලේකම් හා පෑළියංගොඩ විද්‍යාලංකාර පිරිවෙනේ ආචාර්යවරයෙකු ලෙස ද, ක්‍රියා කරන බෙංගමුවේ නාලක හිමියන් මෙරට පවතින ජාතික අර්බුදය පිළිබඳ නිරන්තර අවධානයෙන් යුක්තව කටයුතු කළ හිමි නමකි. වර්තමාන යුද්ධය පිළිබඳව උන්වහන්සේ ගේ අදහස් මෙසේ සටහන් කරමු .

එල්.ටී.ටී.ඊ. සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයකි. ඔවුන්ගේ ත්‍රස්තවාදී ක්‍රියා පිළිබඳව මතා වැටහීමක් අප සතුවෙයි. සිංහල, දෙමළ, මුස්ලිම් අභිංසක සිවිල් ජනයා ඝාතනය කරනු ලැබුයේ කොටි සංවිධානයයි. වෙනත් කිසිදු සංවිධානයක් මේ රටේ අහිංසක සිවිල් ජනයා ඝාතනය කළේ නැත. ආරක්ෂක හමුදා සාමාජිකයින් විශාල පිරිසක් ද ඝාතනය කරනු ලැබුයේ කොටි සංවිධානය වන අතර එවැනි සංවිධානයක් අතිවාර්යයෙන්ම තහනම් කළ යුතුව පවතී.

මෙම හේතු කාරණා උඩ එල්.ටී.ටී.ඊ. සංවිධානය තහනම් කළ යුතු යැයි අප ප්‍රකාශ කළ ද එසේ නොකළ යුතු යැයි කෙනෙකුට හේතු දැක්විය නොහැකිය. හැබැයි මම ඕනෑම අයෙකුට ඒ සඳහා හේතු දැක්වීමට අභියෝග කිරීමට කැමතියි.

කොටි සංවිධානය වෙනුවෙන් කිසිවකුට හෝ සාධාරණ යැයි හේතු දක්වා කොටි තහනම් කළ යුතු නැතැයි පැවසීමට හැකියාවක් ඇත්නම් එවැනි පුද්ගලයෙකු ක්‍රියා කරන්නේ කොටින්ට උඩ ගෙඩි දෙමිනි.

කොටි සංවිධානයේ වැඩපිළිවෙළට එරෙහි වන සියල්ලන් මරා දැමීම සහ ඔවුන් මර්දනයට ක්‍රියා කරන අය මරා දැමීම කොටි පිළිවෙතකි. එහිදී දෙමළ ජාතිකයෙකුට වුවද අත්වන්නේද එම ඉරණමයි. ඒ නිසා එල්.ටී.ටී.ඊ. සංවිධානය දෙමළ ජනතාව වෙනුවෙන් පෙනී සිටින සංවිධානයක් ලෙස කෙසේවත් පැවසිය නොහැකිය.

ශ්‍රී ලංකා යුද හමුදාපති සහ ආරක්ෂක ලේකම්වරයා යන දෙදෙනා ඝාතනයට ලක් කිරීමට උත්සාහ දරන ලද්දේ ඔවුන් දෙදෙනා කොටි මර්දනයට දැඩිව ක්‍රියා කළ අය බැවිනි. ආරාක්ෂක ලේකම්වරයා සහ යුද හමුදාපතිවරයා ඉතා සාර්ථක වැඩපිළිවෙළක් කොටි මර්දනය වෙනුවෙන් ගෙන තිබේය. ඔවුන් දෙදෙනාව ඝාතනයට උත්සාහ කළේ ඒ නිසාය. මෙම උත්සාහය වැරදුණත් තවත් දිනක කොටි තම උපාය මාර්ගය වෙනුවෙන් ක්‍රියාත්මක වීමට ඉඩ තිබේ.

නිවටපු ජනාධිපති චන්ද්‍රිකා මැතිණිය ඝාතනයට උත්සාහ කළේ ද, ඒ වනතුරු කොටි මර්දනයට අදාය විසින් වැඩපිළිවෙළක් ගෙන තිබූ බැවිනි. අදයට එල්ලූ කළ ප්‍රහාරයේදී අඟේ අසක් අහිමිව ගිය අතර ඉන් පසුව ගනු ලැබූ ක්‍රියාමාර්ග කොටින්ට එතරම් තර්ජනයක් වූයේ නැත. ඒ නිසා අපගේ විශ්වාසය වී අත්තේ චන්ද්‍රිකා ඝාතනය කිරීම කොටි අත්හැර දමා ඇති බවයි. මේ නිසා කොටි සංවිධානය නිරන්තරයෙන් උත්සාහ දරන්නේ ඔවුන්ට තර්ජනයක් වන සියල්ලන්ම නිහඬ කිරීම උදෙසායි. ඇමෙරිකාව, එංගලන්තය වැනි ප්‍රබල රටවල එල්.ටී.ටී.ඊ. සංවිධානය තහනම් සංවිධානයකි. එම රටවල් එල්.ටී.ටී.ඊ. ය තහනම් කළේ එල්.ටී.ටී.ඊ. සංවිධානය අප රටේ ත්‍රස්ත ක්‍රියා කරන නිසා නොව අල්-කයිදා ඇතුළු සංවිධාන 20 ගණනක් එම රටවල ත්‍රස්තවාදී ක්‍රියා කරන නිසාත් ඒ අතරට එල්.ටී.ටී.ඊ. යත් සිටින නිසාත්ය.

කොටි සංවිධානය එම ප්‍රබල රටවල්වල තහනම් කළත් එම රටවල් අප රටට පවසා සිටින්නේ, විශේෂයෙන් බළපෙම් කරන්නේ එල්.ටී.ටී.ඊ. ය සමග සාකච්ඡා කරන ලෙසයි. 2002 පෙබරවාරි මස 22 වන දින අත්සන් කළ රනිල් - ප්‍රභා අවබෝධතා ගිවිසුමත් මෙවැනි බළපෙම් එල්ල කිරීමට ප්‍රධාන හේතුවක් බවට පත් වී තිබේ.

මන්දයත්, එම ගිවිසුම මගින් ප්‍රථම වතාවට කොටි සංවිධානය හා ශ්‍රී ලංකා රජය අතර සමානත්වයක් පිළි ඇරන් තිබීමයි. ඒ අනුව බටහිර රටවලට බළපෙම් කිරීමට අවස්ථාව ගිම්බ තිබේ. ශ්‍රී ලංකා රජය හා කොටි සංවිධානය සමාන ඇයිතිවාසිකම් පැවතිය යුතු සමාන බලතල පැවතිය යුතු ආයතන දෙකක් ලෙස සිතීමට හෝ පැවසීමත් බරපතල වරදකි. ඊට හේතුව ශ්‍රී ලංකා

කොටි සංවිධානයේ වැඩපිළිවෙළට එරෙහි වන සියල්ලන් මරා දැමීම සහ ඔවුන් මර්දනයට ක්‍රියා කරන අය මරා දැමීම කොටි පිළිවෙතකි. එහිදී දෙමළ ජාතිකයෙකුට වුවද අත්වන්නේද එම ඉරණමයි. ඒ නිසා එල්.ටී.ටී.ඊ. සංවිධානය දෙමළ ජනතාව වෙනුවෙන් පෙනී සිටින සංවිධානයක් ලෙස කෙසේවත් පැවසිය නොහැකිය.

රජය යනු මෙරට ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජාතීන්ගේ රජයයි. කොටි සංවිධානය යනු සියලු ජාතීන්ට අයත් මේ රට බෙදීමට ක්‍රියාත්මක වන ත්‍රස්තවාදී සංවිධානයකි. එවැනි පරස්පර විරෝධී අසමාන දෙකක් සමානත්වයෙන් සැළකීම විශාල සහ බරපතල වරදක් බව සාධාරණව කටයුතු කරනු ලබන ඕනෑම පුද්ගලයෙකුට වැටහී යන කාරණයකි.

බටහිර රටවල් මෙන්ම ඉන්දියාවද කොටි තහනම වෙනුවෙන් ඊට විරුද්ධව වතුව හෝ කෙලින්ම ක්‍රියා කිරීමට ඉඩ තිබේ. එහෙත් රටේ ආරක්ෂාව හා සංවිධානය වෙනුවෙන් සන ජනතා පරමාධිපත්‍ය ගරු කරමින් ක්‍රියාත්මක වෙන ශ්‍රී ලංකා රජය එවැනි බළපෙම් මත ක්‍රියාත්මක විය යුතු නොවේ. රජයේ ආධාර නොලැබීම, ණය ලබා ගැනීමට නොහැකිවීම වැනි කරුණු නිසාවත් බටහිර බළපෙම්වලට හෝ කොටි තහනම් නොකරන ලෙසට කරනු ලබන කිසිදු ආකාරයේ ඉල්ලීමකට සවන් දිය යුතු නැත. මක්නිසාද යත් ඉහත දක්වන ලද කරුණු අනුව කොටි සංවිධානය තහනම් කළ යුතුම සංවිධානයක් වන බැවිනි. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 6 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව රට බෙදීමට ක්‍රියාත්මක වෙන සහ ඒ සඳහා සාකච්ඡා කරන, මුදල් එකතු කරන සංවිධානයක ක්‍රියාත්මක වන සියලු ක්‍රියා මර්දනය කළ හැකිය. එවැනි පුද්ගලයින් හෝ ආයතනවල ප්‍රජා